444

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩ සටහන

අවසාන පරීක්ෂණය (දෙවන අධ්‍යයන වාරය) - 2006/2007

**ESP 1205 -** තුලනාත්මක අධ්‍යාපනය හා අධ්‍යාපන ගැටළු

කාලය පැය තුනයි.

---

දිනය - 2007.11.11 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

I කොටසේ සියළුම ප්‍රශ්නවලටත් II වන කොටසින් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

## I-කොටස

01. පැරණි ශ්‍රී ලංකාවේ ස්වදේශීය අධ්‍යාපන ක්‍රමයේ පැවති විශේෂිත වූ මට්ටම් තුන නම් කරන්න.

02. කෝල්බෲක් කොමිසමේ නිර්දේශ වල බලපෑම් වශයෙන් අධ්‍යාපනයේ සිදු වූ සංවර්ධනයන් තුනක් දක්වන්න.

03. 1960 දශකය තුල ගුරු අධ්‍යාපනයේ සිදු වූ ප්‍රධාන වෙනස්කම් තුනක් කෙටියෙන් පැහැදිළි කරන්න.

04. (i) සුදු ජාතීන්ගේ ආධිපත්‍යය පවත්වා ගෙන යාම සහතික කිරීම සඳහා දකුණු අප්‍රිකාව විසින් 1948 දී ක්‍රියාවට නංවන ලද ප්‍රතිපත්තිය කුමක් ද?

(ii) එම ප්‍රතිපත්තිය හා සම්බන්ධ පණත් /තීරණ තුනක් නම් කරන්න.

05 "සංවර්ධනය" යන සංකල්පය කාලයත් සමග පරිණාමය වූ ආකාරය කෙටියෙන් පැහැදිළි කරන්න.

06. 1944 බට්ලර් පණත මගින් එක්සත් රාජධානියට හඳුන්වා දුන් ත්‍රිභේදික පාසල් ක්‍රමයේ යහපත් බලපෑම් දෙකක් හා අයහපත් බලපෑම් දෙකක් නම් කරන්න.

07. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ සමාන අවස්ථා ලබා දීමේදී පවතින විෂමතා අවම කිරීම උදෙසා නවතම උපාය මාර්ග තුනක් යෝජනා කරන්න.

08. සංවර්ධනය වෙමින් පවතින රටවල සිසුන් පාසලින් ගිලිහීමට බලපාන හේතු පහක් ලැයිස්තු ගත කරන්න.

(5 x 8 = ලකුණු 40 )

## II වන කොටස

09. 'කන්නන්ගර ප්‍රතිසංස්කරණ තුලින් අධිරාජ්‍යවාදී අධ්‍යාපන ප්‍රතිපත්තිය මගින් ඇති කළ අසමානතා නැති කර, අධ්‍යාපනය සඳහා ඇති විශ්වීය අයිතිය පිළිගැනීම සඳහා සමාජ වෙනසක් පිළිබඳ දැක්මක් ප්‍රක්ෂේපණය කරන ලදී.

-ජාතික අධ්‍යාපන කොමිසම් වාර්තාව 2003 දෙසැම්බර්-

(i) බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී අධ්‍යාපන ප්‍රතිපත්තිය මගින් ශ්‍රී ලංකාවේ සමකාලීන සමාජය තුල ඇති කළ අසමානතා පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) කන්නන්ගර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් රටතුල සමාජ වෙනසක් පිළිබඳ දැක්මක් ප්‍රක්ෂේපණය කළේ කෙලෙසින් ද? (ලකුණු 07)

(iii) මෙම ප්‍රක්ෂේපිත දැක්ම යථාර්ථයක් බවට පත් වූයේ ද? සුදුසු නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(මුළු ලකුණු 20 යි)

10. (i) 1972 විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ ප්‍රාග්වෘත්තීය විෂයය හඳුන්වාදීමේ අරමුණු වූයේ මොනවා ද? (ලකුණු 05)

(ii) ඔබගේ අදහසට අනුව, මෙම විෂයය කෙතරම් අදාළ වූවක් ද? (ලකුණු 07)

(iii) එය මුළුමනින්ම සාර්ථක නොවූයේ නම් එබඳු තත්ත්වයකට බලපෑ හේතු මොනවාද ? (ලකුණු 08)

(මුළු ලකුණු 20)

11. (i) ජපානයේ ද්විතීයික අධ්‍යාපනයේ ප්‍රධාන ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 07)

(ii) ජපානයේ ද්විතීයික අධ්‍යාපනයේ ගැටළු/ප්‍රශ්න තුනක් දක්වන්න. (ලකුණු 06)

(iii) ඔබ දක්වා ඇති ගැටළු/ප්‍රශ්ණ ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපනයේ පවතින ගැටළු/ප්‍රශ්න සමග සසඳන්න. (ලකුණු 07)

(මුළු ලකුණු 20)

12. (i) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය කෙරෙහි අධ්‍යාපනයෙහි ජාත්‍යන්තර සංවර්ධනයන් බලපෑ ආකාරය විස්තර කරන්න.

(ලකුණු 10)

(ii) අධ්‍යාපනයෙහි ජාත්‍යන්තරීකරණය හේතුවෙන් ශ්‍රී ලංකාවට අත් වී ඇති වාසි හා අවාසි පැහැදිලි කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 20)

13. දකුණු ආසියාතික රටවල පවතින අධ්‍යාපන ගැටළු ශ්‍රී ලංකාවේ පවතින අධ්‍යාපන ගැටළු සමග පහත දැක්වෙන අංශ යටතේ සංසන්දනය කරන්න.

(i) අධ්‍යාපන ප්‍රවේශය

(ii) අධ්‍යාපනයෙහි අභ්‍යන්තර කාර්යක්ෂමතාව

(iii) අධ්‍යාපනයෙහි බාහිර කාර්යක්ෂමතාව

14. පහත දැක්වෙන මාතෘකා අතරින් දෙකක් පිළිබඳ සටහන් ලියන්න.

(i) අනිවාර්ය අධ්‍යාපනය යන ඉලක්කය ඉටු කර ගැනීමේදී ශ්‍රී ලංකාව මුහුණ දෙන බාධක

(ii) අධ්‍යාපනය වඩාත් ප්‍රායෝගික හා අදාළ කරවීමට ශ්‍රී ලංකාවේ ග්‍රාමීය අධ්‍යාපන ක්‍රමය (හන්දෙස්ස ක්‍රමය) මගින් ගත් පියවරවල ඵලදායීතාව.

(iii) අධ්‍යාපනය වැඩ ලෝකය හා ගලපාලීමට සංවර්ධිත රටවල් අනුගමනය කරනු ලබන උපාය මාර්ග

(ලකුණු 10 x 2 = 20)

- හිමිකම් ඇවිරිණි. -